සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

| 10 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2024 | 32 S I |
|---|---|---|
| නම - ........................................ | ගණිතය I | කාලය - පැය දෙකයි |

විභාග අංකය

..............................................

..............................................

නිවැරදි බවට නිරීක්ෂගේ අත්සන

**වැදගත්**

මෙම ප්‍රශ්න පත්‍රය පිටු 8කින් සමන්විතය.

මෙම පිටුවෙත්, තුන්වැනි පිටුවෙත්, නියමිත ස්ථානවල ඔබේ විභාග අංකය නිවැරදි ව ලියන්න.

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.

පිළිතුරත් එම පිළිතුර ලබාගත් ආකාරයත් දැක්වීමට ඒ ඒ ප්‍රශ්නය යටින් තබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.

**A** කොටසෙහි අංක 1 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 02 බැගින් ද, **B** කොටසෙහි එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින් ද ලැබේ.

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා පමණි

| | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| A | 1-25 | |
| B | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| | එකතුව | |

| | |
|---|---|
| ................ පරීක්ෂා කළේ | ................ සංකේත අංකය |
| ................ පරීක්ෂා කළේ | ................ සංකේත අංකය |
| ................ ගණිත පරීක්ෂක | ................ සංකේත අංකය |
| ................ ප්‍රධාන පරීක්ෂක | ................ සංකේත අංකය |


## A කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.**


1. $3.0876 \times 10^3$ සාමාන්‍ය ආකාරයට ලියා දක්වන්න.

2. ප්‍රසාරණය කර සුළු කරන්න. $(x+2)(x+3)$

3. $A' \cap B$ අඳුරු කර දක්වන්න.




4. $x$ හි අගය සොයන්න.




5. ක්‍රීඩා උපදේශක නිමල් මහතා ක්‍රීඩකයන් 10 දෙනෙකුගේ බර කිරාගන්නා ලදී. එම මිනුම් වල මධ්‍යනය 50 kg වේ. ක්‍රීඩකයන්ගේ බර කිරාගත් පිළිවෙළට kg වලින් 35, 52, 49, 54, 58, $x$, 39, 48, 67, 65 වේ. $x$ හි අගය සොයන්න.

6. රු. 3 000 ට ගන්නා ලද භාණ්ඩයක් රු. 3600 ට විකිණීමෙන් ලබන ලාභ ප්‍රතිශතය සොයන්න.

7. $35^0$ හි අනුපූරකයේ අගය සොයන්න.

8. මෙම කේන්ද්‍රික ඛණ්ඩයේ චාප දිග 44 cm වේ. එහි අරය සොයන්න.




විභාග අංකය..............................

9. සුළු කර පිළිතුර ධන දර්ශක සහිතව දක්වන්න. $y^2 \times y^3 \div y^7$

10. $4x^2 - 49$ හි සාධක සොයන්න.


11. $6x^2y, 3xy^3, 2xy$ යන වීජීය පද වල කු.පො.ගු. සොයන්න.

12. $ABCD$ සමාන්තරාස්‍රයේ $X$ දිග සොයන්න.




13. සුළු කරන්න. $\frac{8x}{7} - \frac{(2x-3)}{7}$

14. $x^0$ හා $y^0$ අගයන් සොයන්න.





15. මිනිස්සු දෙදෙනෙක් දිනක දී $4\ m^3$ ක පස් ප්‍රමාණයක් ලොරිවලට පටවති. ඔවුන්ට $120\ m^3$ ක පස් ප්‍රමාණයක් ලොරිවලට පැටවීමට ගතවන දින ගණන කීයද?

16. $2y - 6x = 1$ ශ්‍රිතයේ, i. අනුක්‍රමණය


ii. අන්තඃඛණ්ඩය

ලියන්න.

17. රූපයේ ඇති අංගසම ත්‍රිකෝණ දෙක නම් කර, අංගසම අවස්ථාව ලියන්න.




18. A සිට B හි දිගංශය $135^0$ නම්, B සිට A හි දිගංශය සොයන්න.





19. විසඳන්න. $2(x + 5) = 18$

20. වගුවේ දැක්වෙන්නේ පෙට්ටියක ඇති ටොෆි වල රස හා වර්ණයයි.


ළමයෙක් අහඹු ලෙස ගන්නා ලද ටොෆිය රතු වර්ණ එකක් වීමේ සම්භාවිතාව ලියන්න.

| | ඇපල් | අන්නාසි |
|---|---|---|
| රතු | 5 | 4 |
| කහ | 3 | 1 |

21. ABD ත්‍රිකෝණයේ වර්ගඵලය 45 $cm^2$ නම්, CD දිග සොයන්න.




22. $x$ හි අගය සොයන්න.




8723

23. $x < 0$ හා $9 \geq 3 - 2x$ අසමානතා තෘප්ත කරන අගයන් දෙකක් ලියන්න.

24. පොදු පදය $3n + 2$ වන සංඛ්‍යා රටාවේ 12 වන පදය සොයන්න.

25. එකිනෙකට 40 m ක පරතරයකින් පිහිටන A හා B ගොඩනැගිලි දෙකට සම දුරින්ද, A හා B ගොඩනැගිලි යාකරන රේඛාවේ සිට 20 m දුරින්ද, අඹ ගසක් සිටුවීමට සැලසුම් කරයි. එම ස්ථානය පථ පිළිබඳ දැනුම භාවිතයෙන් දළ රූපසටහනෙහි P ලෙස දක්වන්න.



## B කොටස

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න

1. නිහාල් තමා සතු ඉඩමකින් $\frac{1}{5}$ ක් තම බිරිඳට ද, ඉතිරියෙන් $\frac{3}{4}$ ක් තම දරුවන්ට ද, ඉතිරිය ප්‍රජාශාලාවක් සඳහා ද වෙන්කරන ලදී.

   i. බිරිඳට වෙන්කිරීමෙන් පසුව ඉතිරි වන ඉඩම් ප්‍රමාණය මුළු ඉඩමෙන් කොපමණ භාගයක්ද ?

   ii. දරුවන් සඳහා වෙන් කරන ලද ඉඩම් කොටස මුළු ඉඩමෙන් කොපමණ භාගයක්ද?

   iii. ප්‍රජාශාලාව සඳහා වෙන්කළ කොටස මුළු ඉඩමෙන් කොපමණ භාගයක්ද?


   නිහාල්ට දරුවන් තිදෙනෙකු සිටින අතර ඔවුන්ට සමාන ඉඩම් කැබලි බෙදා දුන්විට එක් අයෙකුට පර්චස් 20 ක් ලැබුණේ නම්,

   iv. නිහාල් සතුව තිබූ මුළු ඉඩමේ ප්‍රමාණය පර්චස් කීයද?

   එම ඉඩමේ පර්චස් එකක් රු. 225 000 ලෙස තක්සේරු කර ඇත.

   v. ප්‍රජාශාලාව සඳහා වෙන් කළ ඉඩම් කොටසේ වටිනාකම සොයන්න.

2. රූපයේ දැක්වෙන්නේ පාසලක ක්‍රීඩා උත්සවය සඳහා නිවාසයක් ඉදිරිපිට ප්‍රදර්ශනය කර තිබූ නිවාස ලාංඡනයයි. එය පැත්තක දිග 42 cm වන ABCD සමචතුරස්‍රයකින් හා PQR වන කේන්ද්‍රික ඛණ්ඩයකින් සමන්විත වේ.




   i. කේන්ද්‍රික ඛණ්ඩයේ අරය සොයන්න.

   ii. කේන්ද්‍රික ඛණ්ඩයේ චාප දිග සොයන්න.

   මෙම ලාංඡනය වටා සෙන්ටිමීටර තුනෙන් තුනට නිවාස තුනේ පාට තුනෙන් බොත්තම් අලවා තිබිණ.

   iii. අලවා තිබූ බොත්තම් ගණන කීයද?

   iv. මෙම ලාංඡනය කපා ගැනීමට අවම දිගින් යුතු සමචතුරස්‍ර ලැල්ලක් භාවිත කළේ නම්, එම ලැල්ලේ පැත්තක දිග සොයන්න.

   v. ලාංඡනය සැකසීමේදී අපතේ යන ලැලි ප්‍රමාණයේ වර්ගඵලය සොයන්න.

8723

3. අමල් රුපියල් 25 000 ක් යොදා 2023.01.01 දින ව්‍යාපාරයක් ආරම්භ කළ අතර ඊට මාස හතරකට පසු කමල් රුපියල් 30 000 ක් යොදා එම ව්‍යාපාරයට හවුල් විය. එතැන් සිට මාස තුනකට පසු විමල්ද රුපියල් 40 000 ක් යොදා එම ව්‍යාපාරයට හවුල් විය. වර්ෂයක් අවසන් වන විට ව්‍යාපාරයෙන් රුපියල් 185 000ක ශුද්ධ ලාභයක් ලැබිණ.


i. අමල්, කමල්, විමල් ව්‍යාපාරය සඳහා මුදල් යොදවා තිබූ කාලයන් වෙන වෙන ම සොයන්න.

ලාභ බෙදන්නේ යෙදූ මුදල හා ගතවූ කාලයට අනුව නම්,

ii. අමල්, කමල්, විමල් අතර ලාභ බෙදිය යුතු අනුපාතය සොයන්න.

iii. ඒ අනුව තිදෙනාට ලැබෙන ලාභ මුදල් වෙන වෙන ම සොයන්න.

4. රජගල විද්‍යාලයේ කාලගුණ විද්‍යා ඒකකය මගින් මාස 5 ක වර්ෂාපතනය පිළිබඳ ලබාගන්නා ලද තොරතුරු පහත වට ප්‍රස්තාරයේ දැක්වේ.




i. වැඩිම වර්ෂාපතනයක් ලැබී ඇත්තේ කුමන මාසයේ ද?

මාර්තු මාසයේ ලැබුණු වර්ෂාපතනය 30 mm නම්,

ii. මාස පහ තුළ ලැබූ මුළු වර්ෂාපතනය කොපමණ ද?

පෙබරවාරි මාසයේ වර්ෂාපතනය ජනවාරි මාසයේ මෙන් දෙගුණයක් නම්,

iii. පෙබරවාරි මාසයේ වර්ෂාපතනය කොපමණ ද?

මැයි මාසයේ වර්ෂාපතනය 24 mm නම්,

iv. මැයි මාසයේ වර්ෂාපතනය දැක්වෙන කේන්ද්‍රික ඛණ්ඩයේ කෝණය කීයද?

v. අප්‍රේල් මාසයේ වර්ෂාපතනය කොපමණ ද?

5. (a). 9A ශ්‍රේණියට සම්භාවිතාව පාඩම සඳහා ගුරුතුමී 1 සිට 12 තෙක් අංක ලියන ලද කාඩ්පත් ගෙන එන ලදී. ඒවා පෙට්ටියකට දමා හොඳින් කලවම් කර විමල්ට අහඹු ලෙස එක් කාඩ්පතක් ගන්නා ලෙස ආරාධනා කළාය.

i. විමල් කාඩ්පතක් ගැනීමේ නියැදි අවකාශය ලියා දක්වන්න.

ii. ඔත්තේ සංඛ්‍යාවක් සහිත කාඩ්පතක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

iii. ප්‍රථමක සංඛ්‍යාවක් සහිත කාඩ්පතක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

iv. ඉරට්ටේ සංඛ්‍යාවක් හෝ ත්‍රිකෝණ සංඛ්‍යාවක් සහිත කාඩ්පතක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

v. ලැබුණු කාඩ්පත, වර්ග සංඛ්‍යාවක් සහිත කාඩ්පතක් නොවීමේ සම්භාවිතාව සොයන්න.

***

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න